මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| නාට්‍ය හා රංග කලාව | 9 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ......................................................................................................................

සැලකිය යුතුයි

- ❖ ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස වශයෙන් කොටස් දෙකකින් යුක්තයි.
- ❖ I කොටසේ ප්‍රශ්න සියල්ලටම හා II කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සැපයිය යුතු යි.

## I කොටස

පහත ප්‍රශ්නවලට දී ඇති වරණ අතරින් වඩාත් නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

1) නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී රචකයා මුලින්ම තීරණය කළ යුත්තේ
1. නාට්‍යය තේමාව හා ශෛලියයි
2. ජීවන දෘෂ්ටියයි
3. චරිත හා නළු නිළියන් පිළිබඳවයි
4. ආනුෂංගික අංග පිළිබඳවයි

2) නාට්‍ය පෙළක අනිවාර්යයෙන්ම අන්තර්ගත විය යුතු වන්නේ
1. කථා සාරාංශය
2. පාත්‍ර වර්ගය
3. සට්ඨනය හෙවත් ගැටුමයි
4. ගීතය

3) නාට්‍යයක චරිතයක ස්වභාවය හඳුනා ගැනීමට වඩාත් ඉවහල් වන්නේ
1. වේෂ භූෂණයි
2. නාට්‍යෝපකරණයි
3. ආලෝකයයි
4. වේදිකා පසුතල නිර්මාණයි

4) නාට්‍යයක ශෛලියට අනුව ආනුෂංගික කලාවන්
1. වෙනස් වේ
2. වෙනස් නොවේ
3. වෙනස් නොවුනාට කමක් නැත
4. සමහර අංග පමණක් වෙනස් වීම ප්‍රමාණවත්ය

5) නාට්‍යයක අවස්ථා තීව්‍ර කිරීම සඳහා වඩාත්ම යොදා ගත හැකි ආනුෂංගික අංගය වන්නේ
1. සංගීතයයි
2. වේෂ භූෂණයයි
3. අංග රචනයයි
4. ආලෝකකරණයයි

6) සමාරෝපය යන්න හැඳින්වීම සඳහා වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
1. නළුවෙක් තවත් චරිතයකට ආරෝපණය වීම
2. නළුවෙක් ආවේෂ වීම
3. අභ්‍යන්තර චිත්ත ඒකාග්‍රතාවය ඇති කර ගැනීම
4. නළුවෙක් වෙස්වලා ගැනීම

7) පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය තෝරන්න.
1. වේෂ භූෂණ මඟින් චරිතයක ස්වභාවය හඳුනාගත හැක
2. රූපණය පහසු කිරීම සඳහා ආලෝකකරණය සහය වේ.
3. සංගීතය නාට්‍යයක ප්‍රාසාංගික බව උත්තර්ෂවත් කිරීමට දායක වේ.
4. නාට්‍යෝපකරණ රූපණ කාර්යය පහසු කිරීමට බල නොපායි

8) කදා වළලු නාට්‍යයේ පරමාදර්ශී චරිතය ලෙස පෙන්නුම් කරන්නේ

1. සේරිවානිජ වෙළෙන්දාය
2. කච්ඡපුට වෙළෙන්දාය
3. මිත්තණියයි
4. සිටු දියණියයි

9) ලෝක ස්වභාවයට බොහෝ සමානව අනුකරණය කරන නාට්‍ය ශෛලීය හඳුන්වන නම

1. නාට්‍ය ධර්මී
2. ලෝක ධර්මී
3. ශෛලිගත
4. අර්ධ ශෛලිගත

10) නිශ්චිත ගණිතමය ක්‍රමයකට අනුව වෙන්කළ චලන

1. ස්වාභාවික චලනයි
2. නිර්මිත චලනයි
3. තාලානුකූල චලනයි
4. අංග චලනයි

❖ නාට්‍ය කලාවේ භාවිතාවන තාක්ෂණික වචන කීපයක් හා සම්බන්ධ අදහස් 11 සිට 15 දක්වා ප්‍රශ්නවලින්දැක් වේ. ඒවායේ නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

❖ වරහන් තුළ දී ඇති වචනවලින් ගැලපෙන නිවැරදි වචනය තෝරා දී තිබෙන ප්‍රකාශය ඉදිරියෙන් ලියන්න.
( අංග රචනය, වේෂ භූෂණය, අනුකරණය, අභිනය, ගැටුම )

11. නාට්‍යයක තිබිය යුතු ප්‍රබල ලක්ෂණයකි .............................................
12. එක් අයෙකු නිරූපණය කරන චරිතයම තවත් අයෙකු ඒ ලෙසම ඉදිරිපත් කිරීම .......................................
13. නාට්‍යයක් ප්‍රේක්ෂකයා ඉදිරියට පැමිණවීමේ මාධ්‍ය .................................................
14. නළුවාට චරිතයකට උචිත ලෙස ඇඳුම් ආයිත්තම්වලින් සැරසීම ......................................
15. චරිතයකට උචිත ලෙස මුහුණ සැකසීම ...............................................

❖ පහත දක්වා ඇති වගුවෙහි හිස්තැන්වලට දී ඇති නම් අතරින් ගැලපෙන නම තෝරා වගුව සම්පූර්ණ කරන්න.
( එදිරිවීර සරච්චන්ද්‍ර, හෙන්රි ජයසේන, දයානන්ද ගුණවර්ධන, රංජිත් ධර්මකීර්ති, සුගතපාල ද සිල්වා, සීමන් නවගත්තේගම )

| නාට්‍ය පෙළෙහ නම | නිෂ්පාදක |
|---|---|
| 16. සොඳුරු ආඥාදායකයා | |
| 17. නරිබෑණා | |
| 18. එළොව ගිහින් මෙළොව ආව | |
| 19. සුභ සහ යස | |
| 20. හිරු නැති ලොව | |

( ලකුණු 20 × 1 = 20 )

## II කොටස

සැලකිය යුතුයි

- ❖ පළමු ප්‍රශ්නය හා තවත් 2 කට පිළිතුරු සපයන්න.

1) අතට වළලු ද පයට ගිගිරි ද ලා ගනී කිඳු රඟන සොබනා
වනේ සිඳාඹුවො කඩා මල් පෙති වරල සරසා ගනිති නිතිනා

1. මෙම ගීතය ඇතුළත් වේදිකා නාට්‍යය නම් කරන්න. ( ලකුණු 02 )
2. මෙම ගීත කොටස ගායනා කරන්නේ කුමන චරිතයද ? ( ලකුණු 02 )
3. මෙම නාට්‍යෙය් රචකයා නම් කරන්න. ( ලකුණු 02 )
4. මෙම නාට්‍යය සඳහා පාදක වූ ජාතක කථාව කුමක් ද? ( ලකුණු 02 )
5. මෙහි බෝසත් චරිතය නම් කරන්න. ( ලකුණු 02 )

2) 1. සතර අභිනව නම් කරන්න. ( ලකුණු 02 )
2. රූපණයේ දී සතර අභිනයේ වැදගත්කම විස්තර කරන්න. ( ලකුණු 03 )
3. රූපණ කාර්යය වඩාත් සාර්ථක වීමට ආහාර්ය අභිනයේ වැදගත්කම පැහැදිලි කරන්න.
( ලකුණු 05 )

3) 1. ආනුෂාංගික අංග යනු මොනවාද ? ( ලකුණු 02 )
2. ආනුෂාංගික අංග හා නාට්‍යය අතර පවතින සම්බන්ධය පහදන්න. ( ලකුණු 03 )
3. ආනුෂාංගික අංග භාවිතා කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ විස්තරයක් කරන්න.
( ලකුණු 05 )

4) නිර්දිෂ්ඨ නාට්‍ය පෙළ හෝ ඔබ නරඹා ඇති ඕනෑම වේදිකා නාට්‍යයක් නම් කර එහි පහත අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
1. නාට්‍යයේ රංග ශෛලිය ( ලකුණු 02 )
2. ඔබ දක්වන ලද නාට්‍ය ශෛලිය තහවුරු කිරීම සඳහා කරුණු තුනක් පෙන්නුම් කරන්න.
( ලකුණු 03 )
3. යොදා ගෙන තිබෙන වේෂ භූෂණ හෝ නාට්‍යය උපකරණ නාට්‍යයේ සාර්ථකත්වයට බලපා ඇති ආකාරය ( ලකුණු 05 )

5) 1. ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් දෙදෙනෙක් නම් කරන්න.
( ලකුණු 02 )
2. ඔවුන් දෙදෙනාගේ නාට්‍ය නිර්මාණ තුන බැගින් වෙන් වෙන්ව ලියන්න. ( ලකුණු 03 )
3. ඔබ සඳහන් කරන ලද එක් නාට්‍ය කරුවෙකුගේ නාට්‍යවල ඇති විශේෂ පිළිබඳ විමසීමක් කරන්න.
( ලකුණු 05 )

(ලකුණු $3 \times 10 = 30$ )